# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 50.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

## 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]

එල්.ඩී.—ඕ. 16/2011

### 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අදාල වගන්තිවල වෙනස් බලාත්මකවීමේ දිනයන් නිශ්චිතව දක්වනු ලැබුවහොත් මිස 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සැළකිය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය :—

(අ) එහි (iv) (ආ) උපජේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(ආ) හතරවන උපලේඛනයේ දක්වා ඇති, ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ නොවන භාණ්ඩ හැර, භාණ්ඩ හා සේවා සැපයුම් සඳහා —

(i) 2005 අගෝස්තු මස 2 වන දිනයෙන් ආරම්භවන සහ 2005 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා වර්ෂයකට සියයට විස්සක අනුප්‍රමාණය (සුඛෝපභෝගී අනුප්‍රමාණය) මත එහි බදු ඛණ්ඩය 1/6 ක් වේ;

(ii) 2005 ඔක්තෝබර් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සහ 2010 නොවැම්බර් මස 23 වන දිනයෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා භාණ්ඩ සම්බන්ධයෙන් වර්ෂයකට සියයට විස්සක අනුප්‍රමාණය මත (සුඛෝපභෝගී අනුප්‍රමාණය) එහි බදු ඛණ්ඩය 1/6 ක් වේ;

(iii) 2005 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සේවා සම්බන්ධයෙන් වර්ෂයකට සියයට විස්සක අනුප්‍රමාණය මත (සුබෝපභෝගී අනුප්‍රමාණය) එහි බදු අනුබණ්ඩය 1/6 ක් වේ.

(ආ) ඒ උපවගන්තියේ (v) අනුඡේදයේ —

(i) එහි (ii) වන අයිතමයේ, "2009 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2009 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන්වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි (ii) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

"(iii) 2010 නොවැම්බර් මස 23 වන දිනයෙන් ආරම්භ වන 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අයකල හැකි කාලසීමාවක් සඳහා ශුන්‍ය අනුප්‍රමාණ මත බදු අයකල හැකි භාණ්ඩ හෝ සේවා හැර, එම සපයන ලද භාණ්ඩ හෝ සේවාවල වටිනාකම හෝ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම අනුව සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ) බදු අය කළ යුතු ය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය—

(අ) එහි (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදයේ "එම ඇඟළුම් නිෂ්පාදකයන්ගේ හෝ සේවා සැපයුම්කරුවන්ගේ" යන

වචනවල සිට එම අනුඡේදය අවසානය දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(අ) භාණ්ඩ සැපයුම්ලාභීන් විසින් එකී සපයන ලද භාණ්ඩ ඇත්ත වශයෙන්ම අපනයනය කරන ලද බවට ප්‍රකාශ කරමින් එකී භාණ්ඩ බැහැර කිරීමට අදාළව; හෝ

(ආ) එකී සේවා, අපනයනය කරන ලද ඇඟළුම් නිෂ්පාදනය සඳහා ඇත්ත වශයෙන්ම භාවිත කරන ලද බවට ප්‍රකාශ කරමින් එකතු කළ අගය මත වූ සේවාවන් සැපයීමට අදාළව,

සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත, තත්කාර්ය සඳහා දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට එකී ඇඟළුම් නිෂ්පාදකයා හෝ සේවා සපයන්නා විසින් ක්‍රියාකර ඇති තාක්කල්:

එසේ වුව ද, 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ ඡේදය යටතේ වූ විලම්බන බද්ද දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය."

(ආ) එහි (ඈ) අනුඡේදයේ, "අපනයන සංවර්ධන මණ්ඩලය විසින්" යන වචනවල සිට එම අනුඡේදය අවසානය දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"(අ) භාණ්ඩ සැපයුම්ලාභීන් විසින් එකී සපයන ලද භාණ්ඩ ඇත්ත වශයෙන්ම අපනයනය කරන ලද බවට ප්‍රකාශ කරමින් එකී භාණ්ඩ බැහැර කිරීමට අදාළව; හෝ

(ආ) එකී සේවා, අපනයනය කරන ලද භාණ්ඩ නිෂ්පාදනය සඳහා ඇත්ත වශයෙන්ම භාවිත කරන ලද බවට ප්‍රකාශ කරමින් එකතු කළ අගය මත වූ සේවා සැපයීමට අදාළව,

සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත, තත්කාර්ය සඳහා දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට එකී භාණ්ඩ නිෂ්පාදකයා හෝ සේවා සපයන්නා විසින් ක්‍රියාකර ඇති තාක්කල්:

එසේ වුව ද, 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, මේ ඡේදය යටතේ වූ බද්ද විලම්භන කිරීම දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.”

(ඇ) එහි (*ඈ*) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

“(ඉ) කොමසාරිස් - ජනරාල්වරයා විසින්, (ඇ) හෝ (ඈ) අනුඡේදවල දක්වා ඇති භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් හැර, භාණ්ඩ හා සේවා සැපයීම මත ලියාපදිංචි තැනැත්තෙකු වන ඉල්ලුම්කරුට සවන්දීම සඳහා අවස්ථාවක් ලබාදීමෙන් පසුව සහ එකී ඉල්ලුම්කරු විසින් පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යමින් සිටින ව්‍යාපාරික කටයුතුවල ස්වභාවය සැලකිල්ලට ගෙන, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් මෙකී කාර්ය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව එම භාණ්ඩ සැපයුම්කරුවන් හෝ සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් කරගෙන යනු ලබන තාක්කල් සහ ඒ භාණ්ඩ සහ සේවා ඇත්ත වශයෙන්ම මෙම අනුඡේදයේ සඳහන් කර ඇති ලියාපදිංචි තැනැත්තා වෙත ලබා දී ඇති බවට සහ ඒ භාණ්ඩ හා සේවා එම විශේෂිත කාර්ය සඳහාම උපයෝජනය කරන ලද බවට ප්‍රකාශ කරමින් එයට අදාළව සැපයුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන තාක්කල්,

(i) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් කරන ලද යම් විශේෂිත ව්‍යාපෘතියක නියැලී සිටින ලියාපදිංචි තැනැත්තකු වෙත කරන ලද සැපයීම් සම්බන්ධයෙන්;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ අපනයනකරුවකුට සපයනු ලබන්නාවූ, යම් අපනයනකරුවකුට හෝ නිෂ්පාදකයෙකුට කරන ලද සැපයීම් සම්බන්ධයෙන්;

(iii) අපනයනය සඳහා නිෂ්පාදිත භාණ්ඩවල තත්ත්වය, ස්වභාවය හෝ වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් වන අපනයනකරුවකුට එකතු කළ අගය මත වූ සේවාවන් සපයනු ලබන යම් සැපයුම්කරුවකුට කරන ලද සැපයීම් සම්බන්ධයෙන්;

(iv) පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු වෙත යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවක් තුළ දී එම සැපයුම් ව්‍යාපෘති හා සම්බන්ධිත සැපයුම් වන තාක්දුරට වූ සැපයීම් සම්බන්ධයෙන්,

බදු ගෙවීම් විලම්භනය කරනු ලැබිය හැකි ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2අ) කොමසාරිස් - ජනරාල්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ වූ යම් ලියාපදිංචි කිරීමක් අවලංගු කරන අවස්ථාවක දී, ඒ ලියාපදිංචි තැනැත්තන්ගේ නම් සහ ලියාපදිංචි අංක පිළිබඳ ලැයිස්තුවක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දිනපතා පළවන, පුළුල් සංසරණයක් ඇත්තා වූ දිනපතා පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලැබීමට ඔහු විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ඇ) ඡේදය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(2) වන වගන්තියේ (2) උපවගන්තියේ (අ) ඡේදයේ, (ඇ) ඡේදයේ, (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ—

(අ) එහි (ආ) අනුඡේදයේ "අතිරික්තය, 2006 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන බදු අයකළ හැකි කාලසීමාව සම්බන්ධයෙන් නම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2006 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භව 2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන බදු අයකළ හැකි කාලසීමාව සම්බන්ධයෙන් නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) (ආ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) අතිරික්තය 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් නම්, එම අතිරික්තය, එම බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසු දින හතළිස් පහකට වඩා වැඩි නොවන කාලයක දී හෝ අදාළ බදු අයකළ හැකි කාලසීමාව සඳහා වූ වාර්තාව ලැබුන දිනය යන ඒවායින් පසුව එළඹෙන දිනයේ සිට දින හතළිස් පහකට වඩා වැඩිනොවන කාලයක දී ආපසු ගෙවිය යුතු ය;"

(2) එම වගන්තියේ (6) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ අතුරු විධානයේ "භාණ්ඩ හා සේවා මිළදී ගැනීම මත යෙදවුම් බදු සපයා ඉඩදිය හැකිය," යන වචන වෙනුවට, "භාණ්ඩ හා සේවා මිළදී ගැනීම මත යෙදවුම් බදු සඳහා ඉඩදිය හැකි ය:"

එසේම තවදුරටත්, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ලියාපදිංචි තැනැත්තකු වශයෙන් සේවායෝජකයා විසින්, පළමු උපලේඛනයේ II වන කොටසේ (ආ) ඡේදයේ (iv) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීමේ දක්වා ඇති සේවා ප්‍රතිලාභ වන ආහාර සහ ප්‍රවාහනය සැපයීම බාහිර තැනැත්තකුගෙන් ලබා ගැනීම

මත එම ලියාපදිංචි තැනැත්තා විසින් ගෙවනු ලැබූ බදු එම ලියාපදිංචි තැනැත්තාගේ යෙදවුම් බදු බැර වශයෙන් ඉඩ දිය හැකි ය.

(3) එම වගන්තියේ (10) වන උපවගන්තියේ "මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ බදු අයකළ හැකි" යන වචන සහ ඉලක්කම්වල සිට "යෙදවුම් බද්දේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය." දක්වා වූ කොටස ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"යම් බදු අයකල හැකි කාලසීමාවක් සඳහා ඉඩදිය හැකි යෙදවුම් බද්දේ ප්‍රමාණය පහත දැක්වෙන වැඩිදුරටත් වන සීමා කිරීම්වලට යටත් විය යුතු ය:—

(අ) මෙම වගන්තියේ (5) වන උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ දැක්වෙන පිරිසැකසුම් කිරීමකින් තොරව නැවත විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, 2006 දෙසැම්බර් මස 31 වන දිනට යෙදවුම් බද්දේ අතිරික්තය ද ඇතුළුව, 2007 ජනවාරි මස 1 දින හෝ ඉන්පසු ආරම්භ වන එහෙත් 2010 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව වූ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා එම බදු අයකල හැකි කාලසීමාව සඳහා ප්‍රකාශයට පත් කරන ලද නිමැවුම් බදු ප්‍රමාණයෙන් සියයට අසූ පහක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ ඉඩදිය හැකි යෙදවුම් බදු ප්‍රමාණය යන ඒවායින් අඩු ප්‍රමාණයකට තවදුරටත් සීමා කළ යුතු ය. යම් ශේෂයක් ඇත්නම්, එම ශේෂය, 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන බදු අයකල හැකි කාලසීමාව දක්වා එකී සීමා කිරීමටම යටත්ව, පසුව එළඹෙන බදු අයකළ හැකි කාලසීමාව හෝ කාලසීමා වලදී ඉඩ දිය හැකි යෙදවුම් බදු ප්‍රමාණයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය. 2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යම් ශේෂයක් ඇත්නම්, එම ශේෂය ඉදිරියට රැගෙන යායුතු මෙන්ම යම් බදු අයකළ යුතු කාලසීමාවක් සඳහා එක් එක් මාසය සඳහා අන්තර්ග්‍රහණය නොකළ ප්‍රමාණයෙන් සියයට

දහයකට සමාන ප්‍රමාණයක් ලියාපදිංචිවී ඇති තැනැත්තකු විසින් ඉල්ලා සිටිය හැකි නමුත් එම මුදල් ප්‍රමාණය, නිමැවුම් බද්දෙන් ඉඩදිය හැකි යෙදවුම් බදු බැර අඩු කිරීමෙන් පසු එම තැනැත්තා විසින් ගෙවිය යුතු ශුද්ධ බද්දෙන් සියයට පහක ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(ආ) 2010 දෙසැම්බර් මස 31 වන දින දක්වා හිමිකම්පාන ලද, ඉහත (*අ*) උපඡේදයේ දක්වා ඇති යෙදවුම් බද්ද හැර, 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, එම බදු අයකළ හැකි කාලසීමාව සඳහා ප්‍රකාශයට පත් කරන ලද නිමැවුම් බද්දෙන් සියයට සියයක ප්‍රමාණය හෝ මේ පනතේ විධිවිධාන යටතේ ඉඩ දී ඇති යෙදවුම් බදු ප්‍රමාණය යන ඒවායින් අඩු ප්‍රමාණයකට තවදුරටත් සීමා කළ යුතු ය. යම් ශේෂයක් ඇත්නම්, එම ශේෂය එම සීමාකිරීමටම යටත්ව, පසුව එළඹෙන කාලසීමාව හෝ කාලසීමාවල දී ඉඩදිය හැකි යෙදවුම් බද්දේ කොටසක් ලෙස සලකනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැරක් ඇති, නමුත්, 2011 ජනවාරි මස 1 වන දින සිට සහ ඉන්පසුව මේ පනතේ විධිවිධාන යටතේ බද්දට යටත් විය යුතු බදු අයකල හැකි සැපයුම් නොමැති යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි, (i) වන, (ii) වන හෝ (iii) වන ඡේදවල විධිවිධාන සලසා ඇති ආකාරයට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර ප්‍රමාණය සොයා ගැනීමෙන් පසුව, (*අ*) ඡේදයේ දක්වා ඇති අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර හිලව් කළ යුතු අතර -

(i) ලියාපදිංචි තැනැත්තා 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන

වගන්තිය යටතේ බලපත්‍රලත් විදුලි සංදේශ සේවාවක ක්‍රියාකරුවකු වන අවස්ථාවක, එම හිලව් කිරීම, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ යුතු ය ;

(ii) ආදායම් බදු ගෙවීමට යටත් වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම හිලව් කිරීම, ඔහු විසින් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත යටතේ බදු වශයෙන් ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ යුතු ය;

(iii) ඉහත (i) හෝ (ii) ඡේදවල විධිවිධාන අදාළ නොවන තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට, එම හිලව් කිරීම, කොමසාරිස් - ජනරාල්වරයා විසින් පාලනය කරනු ලබන සහ තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ බදු වශයෙන් එම තැනැත්තා විසින් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ යුතු ය.

මේ අතුරු විධානය ප්‍රකාරව එක් එක් මාසය සඳහා වූ හිලව් කිරීම 2011 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර මුදලින් සියයට දහයක් හෝ එම මාසය සඳහා ඉහත (i), (ii) හෝ (iii) යන අයිතමයන්හි දක්වා ඇති අදාළ බද්දෙන් සියයට පහක් යන ඒවායින් වඩා අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බදු අයකළ හැකි කාලසීමාව.

25*ආ.* (1) සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයකට සහ වෙනත් යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි කාලසීමාව :—

(අ) 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා එක් මාසයක් විය යුතු ය; සහ

(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය.

(2) බදු අයකළ හැකි කාලසීමාවට පසුව එළඹෙන මාසය අවසානයට පෙරාතුව වූ එක් එක් බදු අයකළ හැකි කාලසීමාව සම්බන්ධයෙන් සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් සහ වෙනත් යම් තැනැත්තෙකු විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි වූ වාර්තාවක් සපයනු ලැබිය යුතු ය.

(3) (අ) 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් සහ වෙනත් තැනැත්තකු විසින් ම යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය, මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ වාර්තාව ඉදිරිපත් කිරීමත් සමග අවසාන ගැලපීමක් වෙතොත් එම අවසාන ගැලපීම සිදු කිරීමට යටත්ව, මාසික පදනමක් මත ඊළග මාසයේ විසිවන දිනයේ දී ගෙවිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති පරිදි ගෙවා නොමැති යම් බදු මුදල් ප්‍රමාණයක්, නොගෙවා පැහැර හැර ඇති ලෙස සැලකිය යුතු අතර, මේ උපවගන්තිය අදාළ වන යම් ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තකු මේ පනතේ අර්ථානුකූලව පැහැර හරින්නකු ලෙස සැලකිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු" යන වචනවල සිට "මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ" යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"මෙම පරිච්ඡේදයේ කාර්යය සඳහා එම නිශ්චිත ආයතනයේ අගය එකතු වීම —

(i) 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය හෝ පාඩුව පදනම් කරගෙන; සහ

(ii) 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද අඩු කිරීමෙන් පසුව ශුද්ධ ලාභය හෝ පාඩුව පදනම් කරගෙන,

ගණනය කරනු ලැබිය යුතු ය.".

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(3) යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා ගෙවිය යුතු, දක්වා ඇති බදු මුදල් ප්‍රමාණය (1) වන උපවගන්තියේ නිශ්චිතව එකතු කළ අගයෙන් —

(අ) 2003 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භවන එහෙත් 2004 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව සියයට දහයක් විය යුතු ය;

(ආ) 2004 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2005 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව සියයට පහළොවක් විය යුතු ය;

(ඇ) 2005 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව සියයට විස්සක් විය යුතු ය;

(ඈ) 2011 ජනවාරි මස 1 වන දින සිට ආරම්භ වන කාලසීමාව සඳහා, සියයට දොළහක් විය යුතු ය.".

(3) එම වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(8) මෙම වගන්තිය යටතේ බදු ගණනය කිරීමේ කාර්යය සඳහා සෑම නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් එම බදු ගණනය කිරීමේ සමානුරූපී යෙදුම සැලකිල්ලට ගනිමින් කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබිය යුතු ය.".

(4) එම වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(9) 25ඈ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අගය එකතු කිරීමෙන් සියයට අටක් 2011 ජනවාරි මස 1 වන දින සිට ආරම්භ වන අවුරුදු තුනක කාලය සඳහා කොමසාරිස් - ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව, මෙම කාර්ය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ පිහිටුවා ඇති අරමුදලේ ආයෝජනය කළ යුතු අතර, එම ආයෝජනය ඊළඟ මාසයේ විසිවන දින හෝ එදිනට පෙරාතුව මාසික පදනමක් මත කළ යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 25උෟ වගන්තියේ (1) වන උපවගන්තියේ "මුළු පිරිවැටුම මත 2007 ජනවාරි මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහාම සියයට පහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25උෟ වගන්තිය සංශෝධනය කිරීම.

"මුළු පිරිවැටුම මත —

(අ) 2007 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන සෑම කාර්තුවක් සඳහාම සහ ලියාපදිංචිය යෙදෙන්නාවූ කාර්තුවෙන් ආරම්භ වන්නාවූ සෑම කාර්තුවක් සඳහාම සියයට පහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු ය; සහ

(ආ) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ ලියාපදිංචිය යෙදෙන්නාවූ කාර්තුවෙන් ආරම්භ වන්නාවූ සෑම කාර්තුවක් සඳහාම පහත දැක්වෙන ආකාරයට අයකරනු ලැබිය යුතු ය:—

(i) ලියාපදිංචිය යෙදෙන්නාවූ කාර්තුව ආරම්භයේ සිට සහ 2010 දෙසැම්බර් මස 31 වන දිනට පසුව වසර තුනක කාලයක් ඇතුළත වූ සෑම කාර්තුවක් සඳහාම සියයට දෙකක අනුප්‍රමාණයකින් ;

(ii) (i) වන අයිතමයේ දැක්වෙන වසර තුනක කාලය අවසන් වීමෙන් ඉක්බිතිවම ආරම්භවන වසර තුනක කාලය ඇතුළත යෙදෙන සෑම කාර්තුවක් සඳහාම සියයට හතරක අනුප්‍රමාණයකින් ;

(iii) (ii) වන අයිතමයේ දැක්වෙන වසර තුනක කාලය අවසන් වීමෙන් ඉක්බිතිවම ආරම්භවන වසර තුනක කාලය ඇතුළත යෙදෙන සෑම කාර්තුවක් සඳහාම සියයට අටක අනුප්‍රමාණයකින් ;

(iv) (iii) වන අයිතමයේ දැක්වෙන වසර තුනක කාලය අවසන් වීමෙන් ඉක්බිතිවම ආරම්භවන වසර තුනක කාලය ඇතුළත යෙදෙන සෑම කාර්තුවක් සඳහාම සියයට දොළහක අනුප්‍රමාණයකින්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තිය එහි (1) වන උපවගන්තියේ (*ආ*) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ලියාපදිංචිය ලබාගන්නාවූ කාර්තුව ආරම්භවන දින සිට වසර දොළහක කාලසීමාවක් සඳහා එම ලියාපදිංචිය වලංගු විය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඒ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 25ඒ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

ඉස්ලාමීය මුල්‍ය ගනුදෙනුවලින් පැනනගින සැපයුම් අගය මත බදු අයකළ යුතු බව.

25ඒ. (1) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව යම් ඉස්ලාමීය මුල්‍ය ගනුදෙනුවල සැපයුම් අගය මත, බදු අය කළ යුතු ය.

(2) දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, යම් විශේෂිත ඉස්ලාමීය මුල්‍ය ගනුදෙනුවකින් පැනනගින සැපයුම් අගය බද්දට යටත් විය යුතු ප්‍රමාණය තීරණය කිරීම සඳහා-

(අ) ඉස්ලාමීය මුල්‍ය ගනුදෙනුවකට තුඩුදෙන්නා වූ අවස්ථානුගත කරුණු හඳුනාගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මුල්‍ය ගනුදෙනුවකින් පැනනගින සැපයුම් අගය සොයා දැනගැනීම සඳහා,

අවශ්‍ය විය හැකි පරිදි, කලින් කල, රීති සහ මාර්ගෝපදේශ නිකුත් කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "ඒ ගිවිසුමට අනුව ගෙවීමක් සිදු කරන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ ගිවිසුමට අනුව 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ගෙවීමක් සිදුකරන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල "අදාළවන බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු පහක කාලයක් ඇතුළත" යන වචන වෙනුවට "කවර හෝ වේලාවක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ "vi පරිච්ඡේදය - අභියාචනා" යන ශීර්ෂය යටතේ දැක්වෙන 34 සිට 36 දක්වා වූ වගන්ති (එම වගන්ති දෙක ද ඇතුළුව) එම වගන්තිවල ඇති "2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය" යන වචන සහ "සමාලෝචන මණ්ඩලය" යන වචන එම පරිච්ඡේදයේ නිරූපනය වන සෑම ස්ථානයකම "සමාලෝචන මණ්ඩලය හෝ මේ පනත ප්‍රකාරව අභියාචන ඇසීමේ කාර්ය සඳහා යම් ලිඛිත නීතියක් මගින් සංස්ථාපනය කරන ලද යම් කොමිෂන් සභාවක්" වන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 සිට 36 දක්වා වන වගන්ති සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "තීරණය කිරීම සඳහා මේ වගන්තියේ කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය" යන වචන වෙනුවට "තීරණය කිරීම සඳහා හෝ ගෙවීම් පැහැර හරින ලද බදු සඳහා චෝදනා ගොනු කිරීම සම්බන්ධයෙන් තක්සේරු කිරීමට එරෙහිව යම් අභියාචනයක් විභාගවෙමින් පැවතීමේ කරුණ නිසා පමණක් එම නඩු කටයුත්ත දින තිහක් ඉක්මවන කාලයක් සඳහා කල්දැමීමට හෝ විලම්භනය කිරීමට මේ වගන්තියේ කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය." යන වචන අදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 55වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කළ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) අනේවාසික තැනැත්තකුගේ බදු අය කළ හැකි සැපයුම් සියල්ල ශ්‍රී ලංකාව තුල හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වුව ද, එම සැපයුම් නියෝජිතයාට ලැබුණ ද,

නොලැබුණ ද, එම අනේවාසික තැනැත්තාගෙන් ඍජුවම හෝ නියෝජිතයා නමින් තක්සේරු කළ යුතු අතර, එසේ ඍජුවම හෝ නියෝජිතයා නමින් එසේ තක්සේරු කරන ලද මේ පනත ප්‍රකාරව වන බදු, මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට එම අනේවාසික තැනැත්තාගේ හෝ නියෝජිතයාගේ වත්කම්වලින් නැවත ලබා ගත යුතු ය. එක් නියෝජිතයකුට වඩා වැඩි ගණනක් සිටන අවස්ථාවක, අනේවාසික තැනැත්තාගේ බදු කළ හැකි සැපයුම් සම්බන්ධයෙන් ඔවුන් වෙන් වෙන්ව හෝ එකතුව තක්සේරු කළ හැකි අතර, එම බදු සම්බන්ධයෙන්, මේ පනත ප්‍රකාරව එකතුව සහ වෙන් වෙන්ව යටත් විය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ "එසේම තවදුරටත් 22 වන වගන්තියේ 5වන උපවගන්තියේ (ඇ) (ඈ) හෝ (ඉ) ඡේදවල සඳහන් ලියාපදිංචි තැනැත්තකු විසින් අතිරික්තව ගෙවා ඇති යම් මුදල් ප්‍රමාණය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එසේම තව දුරටත්, 22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදවල සඳහන් ලියාපදිංචි තැනැත්තකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන යම් බදු අයකල හැකි කාලසීමාවකට පෙරාතුව අතිරික්තව ගෙවා ඇති යම් මුදල් ප්‍රමාණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(ඇ) (i) එම තැනැත්තාට තක්සේරුකරුවකු විසින් නිකුත් කර ඇති ලිපියේ සඳහන් කාලසීමාව තුළ දී ආපසු ගෙවීම් පිළිබඳ යම් හිමිකම් පෑමකට අදාළ සම්පූර්ණ සහ වැඩිදුරටත් වූ තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හරින;

(ii) එම තැනැත්තාට කත්සේරුකරුවකු විසින් නිකුත් කර ඇති ලිපියේ නිශ්චිතව දක්වා ඇති ස්ථානයේ දී සහ දිනයේ දී සහ වේලාවේ දී පෞද්ගලිකව පෙනී සිටීම හෝ බලයලත් නියෝජිතයකු මගින් නියෝජනය කිරීම පැහැර හරින,

අවස්ථාවක, කොමසාරිස් -ජනරාල්වරයා විසින්, එම තැනැත්තාගෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහා වූ හිමිකම් පෑම නොසළකා හැරිය හැකි ය:

එසේ වුව ද, කොමසාරිස් - ජනරාල්වරයා විසින් මුදල් ආපසු ගැනීමේ හිමිකම් පෑම නොසළකා හැරීමෙන් පසු සාධාරණ කාලයක් තුළ ලියාපදිංචි තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ රෝගාතුරව සිටීම හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා ලිපියේ සඳහන් කොට ඇති පරිදි, අවස්ථාවෝචිත පරිදි, අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් හෝ සම්මුඛ පරීක්ෂණයට පැමිණ සිටීමෙන් ඔහු වළක්වනු ලැබූ බවට කොමසාරිස් - ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කොන්දේසිවලට යටත්ව ආපසු ගෙවීම පිළිබඳ හිමිකම් පෑමේ පරීක්ෂණය නැවත විවෘත කරනු ලැබිය හැකි ය."

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(4) මේ වගන්තිය යටතේ ආපසු ගෙවනු ලබන මුදල තත්කාර්ය සඳහා ලියාපදිංචි තැනැත්තා වෙත පවරා ඇති බැංකු ගිණුමකට පමණක් කොමසාරිස් - ජනරාල්වරයා විසින් බැර කරනු ලැබිය යුතු ය.”.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 58අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 58අ වගන්තිය ඉවත් කිරීම.)

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය, එහි (ඊ) ඡේදයේ "21 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සැපයීම" යන වචන සහ ඉලක්කම් වෙනුවට "21 වන වගන්තිය, 25ආ වගන්තිය හෝ 25ඌ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සැපයීම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.)

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

(1) "තක්සේරුකරු" යන යෙදුමේ අර්ථනිරූපණයට පෙරාතුව පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

අනේවාසික තැනැත්තකුට අදාලව හෝ යම් හවුල්කරුවකු අනේවාසික තැනැත්තකු වන හවුල් ව්‍යාපාරයට අදාලව "නියෝජිතයා" යන්නට -

(අ) එම තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින නියෝජිතයා, ඇටෝර්නි බලකරු, ඒජන්ත, දේපල භාරගන්නා හෝ කළමනාකරු; සහ

(ආ) ශ්‍රී ලංකාව තුල උත්පාදනය වන හෝ ව්‍යුත්පන්න වන යම් ලාභ හෝ ආදායම් ලබා ගන්නේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් හරහා ද, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය

ඇතුළත් වේ.

(2) "අධ්‍යාපන සේවා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "යම් අධ්‍යාපන ආයතනයක් විසින්" යන වචන වෙනුවට "යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(3) බදු අයකල හැකි කාලසීමාව යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "බදු අයකල හැකි කාලසීමාව" යන යෙදුමෙහි (අ) ඡේදයේ (i) අයිතමය ඉවත් කර (ii), (iii), (iv), (v) සහ (vi) යන අයිතමයන් පිළිවෙලින් (i), (ii), (iii), (iv) සහ (v) යනුවෙන් නැවත අංකනය කිරීමෙන් ;

(4) "බදු අයකළ හැකි සැපයුම" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථනිරූපණය එකතු කිරීමෙන්— -

"විදුලි සංදේශ සේවා" යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන් විසින් වෙනත් සමාන ක්‍රියාකරුවන්ට සහ අවසාන වශයෙන් සේවාදායකයන්ට සපයනු ලබන සේවය අදහස් වේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 1වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම කොටසේ (4) ඡේදයේ (xvii) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමයන් එකතු කිරීමෙන්—

(xviii) 2010 නොවැම්බර් මස 26 වන දින සිට බලපවත්වන පරිදි රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ පෙට්‍රල්, ගල් අගුරු හෝ ගල් කීල

(xix) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව දක්වා ඇති —

(අ) 2010 නොවැම්බර් මස 29 වන දින සිට බලපවත්වන පරිදි, ධාන්‍ය මිශ්‍ර බේකරි නිෂ්පාදන නිපදවීම සඳහා වූ යන්ත්‍රෝපකරණ සහ උපකරණ;

(ආ) 2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, සම් හෝ පාවහන් කාර්මාන්තය හෝ බෑග් නිෂ්පාදනය සඳහා වූ යන්ත්‍රෝපකරණ, මෝටර් හෝම්ස්, ටැක්සි මීටර්, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ අමතර කොටස්, විද්‍යුත් උපකරණ හෝ විලාසිතා ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍ය;

(ඇ) 2010 ජුනි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, සැහැල්ලු බර සහිත විදුලි සහ විද්‍යුත් අයිතමයන්;

(ඈ) 2010 අගෝස්තු මස 16 වන දින සිට බලපවත්වන පරිදි පළතුරු බීජ;

(ඉ) 2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි විදුලි සංදේශ උපකරණ.

(xx) 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, විදුලි සංදේශ කර්මාන්තය සඳහාම පමණක් ආනයනය හෝ මිළදී ගනු ලැබූ බවට හඳුනාගත් සහ විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවකු විසින් ආනයනය කරනු ලැබූ හෝ මිළදී ගන්නා ලද යම් යන්ත්‍රෝපකරණ හෝ අධිතාක්ෂණික උපකරණ;

(xxi) (2010 අගෝස්තු මස 18 වන දින හෝ ඉන්පසුව කරන ලද ආනයන ද ඇතුළුව) ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම පමණක් පාවිච්චි කිරීම සඳහා වූ අමතර කොටස් සහ උපාංග;

(2) එම කොටසේ (ආ) ඡේදයේ —

(අ) (i) වන අයිතමයේ (අ) වන උපඡේදයේ ඇති "(2006 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) අධ්‍යාපන ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීම" යන වචන සහ ඉලක්කම් වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්—

"(අ) (1) (2006 ජනවාරි මස 1 වන දින සිට 2010 දෙසැම්බර් මස 31 වන දින දක්වා බලපවත්වන පරිදි) යම් අධ්‍යාපනික ආයතනයක් විසින් සපයනු ලබන අධ්‍යාපනික සේවා; සහ

(2) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි), යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් සපයනු ලබන අධ්‍යාපනික සේවා;"

(ආ) (ii) අයිතමයේ (ආ) වන ඡේදයේ (අ) උපඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්;

"(අ) (i) එම බදු ගිවිසුමට 2004 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ඇතුළත් වී ඇත්නම්, ආසන සංඛ්‍යාව විසි අටකට අඩු නොවන්නා වූ ද, පොදු මගී ප්‍රවාහන

සේවා සඳහා භාවිතා කරනු ලබන්නාවූ ද, මෝටර් කෝච්;

(ii) ලොරි, ටැක්ටර් හෝ මගී ආසන සංඛ්‍යාව විසි අටකට නො අඩු වූද, පොදු මගී ප්‍රවාහන සේවා සඳහා භාවිතා කරනු ලබන්නා වූ ද, මෝටර් කෝච් රථ සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් හෝ යම් පළාත් මාර්ග මගී ගමනාගමන අධිකාරියක් මගින් නිකුත් කරන ලද මගී සේවා බලපත්‍රයක් දරන්නකු විසින් 2011 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු යෙදෙන්නාවූ ගෙවීම් වන යම් කුලී වාරිකයක් සම්බන්ධයෙන් ";

(3) (xxx) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් :—

"(xxxi) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) විදුලි සංදේශ සේවා;

(xxxii) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) ජීව අපද්‍රව්‍ය භාවිතා කරමින් දේශීය වශයෙන් නිෂ්පාදිත පැලට් සහ බ්‍රිකට්;

(xxxiii) 2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි දේශීය වශයෙන් සංවර්ධිත මෘදුකාංග;

(xxxiv) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) රක්ෂණ ව්‍යාපාරයේදී කොමිස් හෝ වන්දි මුදල් වශයෙන් යම් දේශීය රක්ෂණ සමාගමකට ප්‍රතිරක්ෂණ සේවා මගින් ලැබුණු ලැබීම්;

(xxxv) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව";.

(4) එම කොටසේ (ඇ) ඡේදයේ (xxviii) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීමෙන් එම ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(xxix) (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශිර්ෂ අංක යටතේ ගුවන් යානා උත්තේජක සහ කොටස්;

(xxx) රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, රුපියල් විසිපන්දහසකට නොවැඩි වටිනාකමක් සහිත ව්‍යාපාරයකට අදාළව වන නියැදි";.

(5) එම කොටසේ (ඊ) ඡේදයේ (ii) වන සහ (iii) වන අයිතම ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් —

"(ii) (අ) රටෙහි ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගෙන ඇති, රජය විසින් බදු දරන්නා වූ යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා වූ භාණ්ඩ හෝ සේවා (2008 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි) ; හෝ

(ආ) රජයේ අමාත්‍යාංශවලට සෘජුවම කරනු ලබන විදේශ ණය හෝ පරිත්‍යාග තුළින් අරමුදල් සපයනු ලබන යම් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා (2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි),

එවැනි සෑම ව්‍යාපෘතියක්ම මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එකී අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපාකාර සමිති පනත යටතේ ලියාපදිංචි කොට ඇති යම් සමිතියක් හෝ පළාත් සභා මගින් පනවා ඇති අදාළ ප්‍රඥප්ති යටතේ එසේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා ඇති හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස මගින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා";

(6) එම කොටසේ (උ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඌ) අශක්නුතාවයට පත් හමුදා සෙබලුන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන තාක්කල් වූ ද, එම අශක්නුතාවයට පත් හමුදා සෙබලුන්ගේ පුනරුත්ථාපනය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යෑම සඳහා පිහිටුවන ලද යම් ආයතනයක භාණ්ඩ හෝ සේවා (2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි."

**21.** රුපියල් මිලියන සියය නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත, යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ යම් මුල්‍යාමය ගැටලු හේතුවෙන් 2010 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවීමට නියමිත බදු ගෙවීම පැහැර හැර ඇති, යම් භාණ්ඩ හෝ සේවා සපයන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්ද ගෙවීමෙන් නිදහස් විය යුතු ය: ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තව දුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් ඉදිරි බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**22.** 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීමෙන් අවසන් වන කාලය තුළ දී, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු එකතු කර ගන්නා යම් තැනැත්තෙක් නිසි බලය ඇතිව ක්‍රියාකර ඇති බවට සලකනු ලැබිය හානිපූරණය

යුතු අතර, එවැනි එකතු කර ගැනීමක් සියලු කාර්ය සඳහා වලංගු ලෙස සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එම තැනැත්තා එවැනි යම් එකතු කර ගැනීමක් සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් හානිපූරණය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

23. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් අති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.